# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

නො. 7,871 — 1931ක්වූ ජූලි මස 24 වෙනි දිනවූ සිකුරාද.

## Part IV. — හතරවෙනි කාණ්ඩය.

### ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම.

වර්‍ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—බලබැද්දේ මහකැලෑවට යෑම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්‍ෂ 1876වේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රිසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. 14,313. ගම—උඩමිල.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | කහටපිටිය .. | පොල්ගස් ගදකක් තිබෙන ඉඩම | බටපොල පදිංචි පේද්‍රුරුහේවා අර්නෝලිස් ද සිල්වා | 0 0 5·2 |
| 2 | එම .. | ඉඩම (වැටිල්ලක් නැතු) .. | බටපොල පදිංචි පේද්‍රුරුහේවා ජනිස් ද සිල්වා .. | 0 0 3·4 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඔනෑකර තිබෙන හැටියට මෙසින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්‍ෂ 1931ක්වූ අගෝස්තු මස 17වෙනි දින පස්වරු 2කේ කාලයමට ගාල්ලේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අයුරුවේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙසින් දැනගත යුතුයි.

වර්‍ෂ 1931ක්වූ ජූලි මස 16වෙනි දින
ගාල්ලේ කච්චේරියේදීය.

ජී. ඇස්. වුඩ්මන්,
ආණ්ඩුවේ දිසා ඒජන්තවරයා.

---

වර්‍ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—ඉහළගොඩ ආණ්ඩුවේ ස්වභාෂා ගැහැණු පාඨශාලාවට යෑමට පාරක් තැනීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්‍ෂ 1876වේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රිසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. 14,318. ගම—ඉහළගොඩ.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | මියගහඅද්දර නොහොත් ආඩිවලකුඹුර | කුඹුර .. | ඉහළගොඩ පදිංචි (1) පී. ඩබ්ලිව්. ගුණවර්ධන, (2) ආඩිගේ සැඳිරිස්, (3) එම බබුන්, (4) අලවික්තේකන්කානම්ගේ සියදෝරිස්, (5) ආඩිගේ නෝන්නෝනාමි, (6) එම පුංචිහාමි නොහොත් කිංකිනිහාමි, (7) එම බබුන් අප්පු, (8) වෙඩිකන්ත්‍රිගේ එරමානිස් | 0 0 1·23 |
| 2 | එම .. | එම .. | ඉහළගොඩ පදිංචි (1) ආඩිගේ පුංචිහාමි, (2) වක්වැල්ලවිතානගේ ජුලියස් ද සිල්වා | 0 0 0·92 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදු ජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඔනෑකර තිබෙන හැටියට මෙසින් දැනුම්දෙමි.

399——J. N. 11071–119 (7/31)
S 1

ඉහත කී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑම දෙනාම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1931ක්වූ අගෝස්තු මස 17වෙනි දින පස්වරු 2ගේ කාහිසමට ගාල්ලේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1931ක්වූ ජූලි මස 16වෙනි දින
ගාල්ලේ කච්චේරියේදීය.

ජී. ඇස්. වුඩ්මන්,
ආණ්ඩුවේ මහා ඒජන්ත වරයා.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3ගේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—කල්පිටියේ කන්ඩකුලියේ සෝකොලයක් ගොඩනැගීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876ගේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රිසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නියිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩමනම්:—

සිතියමේ නො. 7,528. ගම—කන්ඩකුලි.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 1 | පෙරියතෝට්ටම් .. | අවුරුදු 50ක් වයසැති පොල්ගස් 22ක්ද, කෙහෙල් පඳුරු 4ක්ද තිබෙන වත්ත, එහි තාවකාලික සෝකොල ගොඩනැගිල්ලක්ද තිබේ | කන්ඩකුලියේ ඇස්. ඇම්. සෙගු ලාබ්බු මරිකාර් | 0 | 1 | 6·7 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාවා තිබෙන බව පොදු ජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහත කී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑම දෙනාම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1931ක්වූ අගෝස්තු මස 24වෙනි දින පෙරවරු 10ගේ කාහිසමට කල්පිටියේ තානායම්පලේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1931ක්වූ ජූලි මස 18වෙනි දින
පුත්තලම් කච්චේරියේදිය.

වී. කුමාරස්වාමි,
ආණ්ඩුවේ උප ඒජන්ත වරයා.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3ගේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—කල්පිටියේ පල්ලිවාසල්තුරේ සෝකොලයක් ගොඩනැගීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876ගේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රිසභාවේ මන්ත්‍රණයඇතුව උතුමාණන්වහන්සේගෙන් නියිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම නම්:—

සිතියමේ නො. 7,529. ගම—පල්ලිවාසල්තුරේ.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 1 | මාවඩිතෝට්ටම් .. | වතත, මැරිගන යන වයස අවුරුදු 1 පොල්ගස් 4ද, වයස අවුරුදු 10 අඹගහක්ද, තාවකාලික ගොඩනැගිල්ලක්ද තිබේ | යූ. ඇස්. ඇම්. ඇම්. හබීබු මුහම්මදු මරික්කාර් සහ ඇම්. කාසිම් මරිකාර් | 0 | 1 | 32 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑම දෙනාම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1931ක්වූ අගෝස්තු මස 24වෙනි දින පෙරවරු 10ගේ කාහිසමට කල්පිටියේ තානායම්පලේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1931ක්වූ ජූලි මස 18වෙනි දින
පුත්තලම් කච්චේරියේදීය.

වී. කුමාරස්වාමි,
ආණ්ඩුවේ උප ඒජන්ත වරයා.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3ගේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—කල්පිටියේ කන්ඩකුඩාවේ සෝකොලයක් ගොඩනැගීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876ගේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රිසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නියිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. 7,537. ගම—කන්ඩකුඩාව.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 1 | කන්ඩකුඩාමාවලාඩිකානි | පොල්වත්ත, අවුරුදු 60ක් වයසැති පොල්ගස් 3ක්ද, පොල්අතු සෙවිලිකල මැටියෙන් සාදනලද සෝකොලයක්ද, මැටිපැලක්ද, යකඩ කක්කුස්සියක්ද තිබේ | අලන්කුඩාවේ කේ. පී. ඇස්. සේගුසිකන්ඩර් | 0 | 2 | 2·2 |
| 2 | කොණ්ඩඅඩිකානි .. | අවුරුදු 60 පොල්ගහක්ද, අවුරුදු 30 පොල්ගස් පහක්ද, අවුරුදු 8 පොල්ගස් හතරක්ද, අවුරුදු 5 පොල්ගස් පහක්ද තිබෙන පොල්වත්ත | එම .. | 0 | 0 | 32 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑම දෙනාම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1931ක්වූ අගෝස්තු මස 24වෙනි දින පෙරවරු 10ගේ කාහිසමට කල්පිටියේ තානායම්පොලේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1931ක්වූ ජූලි මස 18වෙනි දින
පුත්තලම් කච්චේරියේදීය.

වී. කුමාරස්වාමි,
ආණ්ඩුවේ උප ඒජන්ත වරයා.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3ගේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—බලන්ගොඩ-කල්පේ පාර පලල්කිරීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876ගේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රිසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නියිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. 288. ගම—ඇල්ලේපොල.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 217A | ලිඳගාවාලියද්ද .. | පාර .. | ඩබ්ලිව්. මුරුගේසු සහ තවත් අය .. | 0 | 0 | 8·3 |
| 248A | කටුකැත්දේකැටිය .. | එම .. | වයි. එච්ස් සිත්හෝ .. | 0 | 0 | 6·2 |
| 267A | දිරූන්කුඹුරේගොඩවත්ත, තිරුවනාකැටියේවතත, තිරුවනාකැටියේහේන | එම .. | ආර්. ද ඇස්. මුණසිංහ සහ තවත් අය .. | 0 | 0 | 10·3 |
| 286A | මාලිගාකැන්න .. | එම .. | එච්. හරමානිස සහ තවත් අය .. | 0 | 0 | 9·8 |

| අංක. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාර කියන්නෝ. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| | | සිතියමේ අංක. 388. ගම—රත්මලවින්න. | | |
| 18A | වෙරළුගස්තලාව, නාවල හින්න | පාර | පෙල්ලසියා පුල්ලේ | 0 0 8·3 |
| | | සිතියමේ අංක. 479. ගම—හොරකැටිය. | | |
| 27A | හොරකැටිමුකලාන | පාර | සී. ඔබිලිව්. හරමානිස් | 0 1 3·2 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දන්වාලීම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1931ක්වූ අගෝස්තු මස 31වෙනි දින පස්වරු 3ගේ කනිසමට බලන්ගොඩ සර්කිට් බංගලාවේදී මා ඉදිරිපටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1931ක්වූ ජූලි මස 21වෙනි දින
රත්නපුරේ කච්චේරියේදීය.

සී. එච්. කොලින්ස්,
සබරගමු පලාතේ ආණ්ඩුවේ ඒජන්ත වෙනුවට.

---

## වැන්ඩර්ස් නම් ඉල්ලුම්පත්‍ර පිළිබඳ දැන්වීම.

### මරදානේ අළුත් තැපැල් කන්තෝරුව සඳහා ගත් ඉඩම බදුදීම.

මෙහි පහත සඳහන් කොන්දේසිවලට යටත්ව, වර්ෂ 1931ක්වූ අගෝස්තු මස 10වෙනි දින පටන් අවුරුද්දකට මරදානේ අළුත් තැපැල් කන්තෝරුව සඳහා ගත් ඉඩමේ පිහිටි ගොඩනැගිලි සහ ගස්වල බද්ද මිලයටගැනීම පිණිස සිල් තබා එවනුලබන වැන්ඩර්ස් නොහොත් ඉල්ලුම්පත්‍ර බස්නාහිර පළාතේ දිසාපතිතුමා විසින් භාරගන්නවා ඇත.

2. එකී වැන්ඩර්ස් නොහොත් ඉල්ලුම්පත්‍ර වර්ෂ 1931ක්වූ අගෝස්තු මස 7වෙනි සිකුරාදා සවස 1 වනතුරු කොළඹ කච්චේරියේදී භාරගෙන එම වේලාවට කඩාබලනු ලැබේ.

3. වැන්ඩර්ස් නොහොත් ඉල්ලුම්පත්‍ර එවන්නාවූ සියලු දෙනාම එම ඉල්ලුම්පත්‍ර හැබෑවූ ඒවා බව දිසාපතිතුමාට ඒත්තුගැනීම පිණිස තමින් හෝ තමන් වෙනුවෙන් ඒට නිසි බලඇලත් අයෙක් එම වේලාවට පෙණීසිටින්ට ඕනෑය.

4. වැඩි විස්තර කොළඹ කච්චේරියේදී ඉල්ලා බලාගත හැක.

ඇම්. ඇම්. වෙඩර්බර්න්,
බස්නාහිර පළාතේ දිසාපතිතුමා වෙනුවට.

වර්ෂ 1931ක්වූ ජූලි මස 20වෙනි දින
කොළඹ කච්චේරියේදීය.

### කොන්දේසි.

1. මිළයටගන්නා අය සම්පූර්ණ බදු මුදල වෙන්දේසි දවසේ දීම ගෙවිය යුතුයි.

2. මිළයටගත් අයට ඉඩමේ ඵලප්‍රයෝජන ගැනීමේ යා එහි ගොඩනැගිලි තිබේනම් ඒවායේ පදිංචිවීමේ අයිතිය තිබේවි.

3. මිළයටගත් අය හෝ ඔහුගේ වැඩකරුවන් විසින් හෝ කිසිම ගහක් කැපීම, වැටක මායිමක හෝ ගොඩනැගිල්ලක වෙනසක්කිරීම තහනම්ය.

4. දිසාපතිතුමා විසින් ඉල්ලීමක්කල විටකදී මිළයට ගත් අය වැටමල් බැඳීමට බැඳී සිටියි.

5. මිළයටගත් අය විසින් එම ඉඩම යහපත්ලෙස පිරිසුදුව තබාගැනීමද, සෑම අයබදුම ගෙවීමද, නාගරික සභාවේ අණපණත්වලට එකඟව ක්‍රියාකිරීමද කළයුතුයි.

6. දිසාපතිතුමාට හෝ එතුමාගේ බලයපිට ක්‍රියාකරණ කෙනෙකුට බදුකාරයාට මාසයක් කල්දීමෙන් එහි භුක්තිය උවමනා ප්‍රස්ථාවකදී ආපසු ගතහැක.

7. බස්නාහිර පළාතේ දිසාපතිතුමාගෙන් ලියවිල්ලකින් ලබාගත් අවසරයක් නොමැතිව මිළයටගත් අය විසින් එකී ඉඩමේ හෝ ගොඩනැගිලිවල බද්ද වෙන කෙනෙකුට පැවරීම විකිණීම හෝ දෙවන බද්දක් දීම තහනම්ය.

8. මිළයටගත් අය විසින් පොල්ගස් රා හෝ තෙලිජ්ජ ගැනීම සඳහා මැදීමට ඉඩදීම තහනම්ය.

9. බද්ද අවසානවන්ට ප්‍රථම එම ඉඩම සම්පූර්ණයෙන් හෝ ඉන් කොටසක් ආණ්ඩුවට උවමනා කළහොත් මාසයක් කල් ඇතුව දැන්වීමක් කළවිට එය ආණ්ඩුවට භාරදිය යුතුයි. ආණ්ඩුව විසින් භුක්තිය භාරගනුලැබූ ඉඩම් කොටසේ හෝ සම්පූර්ණ ඉඩමේ ඉතිරි බදුකාලයට වැටහෙන බදුමුදල නැවත මිළයටගත් අයට ගෙවනවා ඇත.

10. මිළයටගත් අය දිසාපතිතුමාට හෝ එතුමාගේ නියමයපිට පැමිණෙන කෙනෙකුට ඉඩම පරීක්ෂාකිරීම සඳහා සුදුසුවේලාවලදී ඒට ඇතුල්වීමට ඉඩහැරිය යුතුයි.

11. ඉඩමේ දැනට තිබෙන ලකුණු, කණු, අගල් ආදිය අස්කිරීමක් හෝ වෙනස්කිරීමක් නොකරීමට මිළයටගත් අය වගබලාගත යුතුයි.

12. ඉහතකී කොන්දේසි කඩකළහොත් එම ඉඩමේ භුක්තිය භාරගෙන මිළයටගත් අය හෝ ඔහුගේ වැඩකරුවන් එයින් අස්කිරීමට දිසාපතිතුමාට බලය තිබේ.

13. එක ඉල්ලුම්පත්‍රයක් හෝ සියළුම ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට දිසපතිතුමාට බලය තිබේ.

### ඉඩමේ තොරතුරු.

අංක. 19,924 දරණ පලූගේ පෙන්නුම්කරණ මරදානේ අළුත් තැපැල් කන්තෝරුව සඳහා ගත් පොල්ගස් 19ක්, කොස්ගස් 2ක්, පේරගස් 3ක්, අත්තික්කාගහක් සහ අලුත ගොඩනගනලද කාලික කඩ 2ක් සහ තාවකාලික ගොඩනැගිලි 4ක් ඇති ඉඩමවේ.

---

වර්ෂ 1931ක්වූ අගෝස්තු මස 7වෙනි සිකුරාදා දවල් 12ට කොළඹ කච්චේරියේදී බස්නාහිර දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් වර්ෂ 1931ක්වූ අගෝස්තු මස 1වෙනි දින සිට පුරා අවුරුද්දකට පරණ උමෙත්තක නිවාසයෙහි (සිස්සන් කොටුව) පිහිටි මෙහි පහත සඳහන් ගස්කොලන්වලින් ලැබෙන ප්‍රයෝජනයේ බද්ද මෙහි පහත පෙනෙන කොන්දේසිවලට යටත්ව වෙන්දේසිකර විකුණන්ට යෙදෙන බව දන්වමි.

1. බද්ද මිලේටගත් අය විසින් බදු මිල සම්පූර්ණයෙන්ම වෙන්දේසි දවසේදීම ගෙවිය යුතුයි.

2. දැනට පවතින යම් වැටක් හෝ මායිමක් වෙනස්කරන්ට වත් යම් ගහක් කපන්ටවත් ගැනුම්කාරයාට හෝ ඔහුගේ වැඩකරුවන්ටවත් අවසර නැත.

3. කලව් පොල්, කුරුම්බා යනාදිය ගැනුම්කාරයා විසින් හෝ ඔහුගේ වැඩකරුවන් විසින් වත් කැඩීම තහනම්ය.

4. ඒජන්ත උන්නාන්සේගෙන් කලින් ලියවිල්ලක් පිට අවසර ඇතුව මිස නැත්නම් ඉඩම යම් කෙනෙකුට පවරන්ට වත් නැවත බදු දෙන්ටවත් ගැනුම්කාරයාට අවසර නැත.

5. බදුකාරයා විසින් නාගරික සභාවේ සියලුම වරිපනම් කාසි ගෙවන්ට ඕනෑය.

6. බදුකාරයාට මාසයකට කලින් දැනුම්දී නැවත ඉඩම භාරගන්ට ඒජන්ත උන්නාන්සේට හෝ ඔහුගේ බලය පිට ක්‍රියාකරන්නෙකුට බලය තිබේ.

7. මිලේටගත් අය විසින් ඉඩම පිරිසුදුව හොඳකාර තිබෙන්ට ඕනෑවා සහ නාගරික සභාවේ අණපණත්වලට යටත්ව ක්‍රියාකළ යුතුයි. තවද කිරි එලදෙනුන්ට හෝ මී දෙනුන්ට තණ කෑමට ඉඩඇරීම තහනම්ය.

8. කැපීමට ඕනෑකරණ ගස් සියල්ලක්ම ඒජන්ත උන්නාන්සේට කැප්පවීමට බලය තිබේ. ඒට වැටහෙන මුදල බදුකාරයාට ආපසු දෙනුලැබේ.

9. ඉහත සඳහන්කරන්ට යෙදුන කොන්දේසි කඩකළොත් වන්දිමුදලක් නොගෙවා ගැනුම්කාරයා ඉඩමෙන් අහක්කර නැවත අයිතිවාසිකම් භාරගන්ට ඒජන්ත උන්නාන්සේට බලය තිබේ.

10. යම් ඉල්ලීමක් බාරගන්ට හෝ නොගන්ට ඒජන්ත උන්නාන්සේට බලය තිබේ.

ඉහත සඳහන්කර තිබෙන ගස්.

මුරුංගගස් 50යි.
පොල්ගස් 24යි.
කොස්ගස් 4යි.
අඹගස් 5යි.
රටදෙල්ගස් 3යි.
කෙසෙල්ගස් 8යි.

ඇම්. ඇම්. වෙබර්බන්,
බස්නාහිර දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ.

වර්ෂ 1931ක්වූ ජූලි මස 20වෙනි දින
කොළඹ කච්චේරියේදීය.

---

වර්ෂ 1931ක්වූ ඔක්තෝබර් මස 1වෙනි දින පටන් 1932ක්වූ සැප්තැම්බර් මස 30වෙනි දිනෙන් අවසාන මාස කාලයට මෙහි පහත සඳහන්වෙන බස්නාහිර පලාතේ තොටුපල් රේන්ද මිලේට ගැනීම පිණිස දෙන වැන්ඩර්ස් හෙවත් ඉල්ලුම්පත්‍ර වර්ෂ 1931ක්වූ අගෝස්තු මස 10වෙනි සඳුදා දවල් 12ට කොළඹ කච්චේරියේදී බස්නාහිර පලාතේ ඒජන්ත උන්නාන්සේ විසින් භාරගනු ලැබේ.

මෙහි පහත දක්වන එක එක රේන්දයට වෙන වෙනම වැන්ඩර්ස් හෙවත් ඉල්ලුම්පත්‍ර දියයුතුයි.

භාරගන්නාලද ඉල්ලුම්පත්‍රය අයිතිකාරයා විසින් දෙලොස් මාසයට ගත් මුදලෙන් දහයෙන් කොටසක් මුදල්වලින් වහාම මෙහි තබන්ට ඕනෑය. එම ඉල්ලීම උතුමාණන්වහන්සේ විසින් භාරගන්ට යෙදුනේනම්, ඔහුගේ ඉල්ලීම උතුමාණන්වහන්සේ විසින් ඒත්තුගත් බව දැනුම්දුන් දින පටන් 30 දවසක් ඇතුලතදී 12 මාසයකට ඉල්ලූ ගණනින් දෙකෙන් පංගුවකට වටිනා ඇප ඒත්තුගත් මුද්‍ර ඔප්පුවලින් හෝ තුනෙන් පංගුවකට වටිනා ඇප මුදලෙන් හෝ තිබා සම්පූර්ණකරන්ට ඕනෑය.

ඇප පිණිස තබනලද ඔප්පු සෝදිසිකිරීම සඳහා ආණ්ඩුවේ පෙරකදෝරු මහත්වරුන්ට ගෙවියයුතු ගාස්තුවද, ඇප ඔප්පු සෑදීමටද, ඒවා සෝදිසිකර සම්පූර්ණකෙරීමටද, ඉඩම් තක්සේරු කිරීමට සහ ඇප ඔප්පු රෙජිස්තර්කෙරීමටද, වර්ෂ 1909ක්වූ 22වෙනි ආඥාපණත අන්දමට ඔප්පුවලට අලවන්ට ඕනෑ මුද්දර ගාස්තුවද ඔහු විසින් ගෙවන්ට ඕනෑය.

ඇප වෙනුවෙන් තිබනලද ඉඩම්වල ඔප්පු, ඒවා මීට ප්‍රථම ඇපෙක්කට නොහොත් උකසකට යටත්නැති බවට ඉඩම් ලියාපදිංචිකරණ රෙජිස්ත්‍රාර්තැනගෙන් සහතිකපත්‍රයක් ලබාගත යුතුයි. මේ සහතිකපත්‍ර ලබාගැනීමට ඕනෑකරණ වියදම ඇප තබන අය විසින් දැරිය යුතුයි.

මේ ගැණ වැඩිදුර කාරණ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන් ඉල්ලුම්කළවිට දැනගන්ට පුළුවන.

ප්‍රධාන පාරවල්වල පාලම් රේන්ද.

ග්‍රෑන්ඩ්පාස්—සැන්සෙබැස්තියම් ඇල රේන්දය.

අයකරන ස්ථානය.

ග්‍රෑන්ඩ්පාස්එක සේදවත්තට යාවන පාලමේ ග්‍රෑන්ඩ්පාස් එක පැත්තෙන්ය.

ප්‍රධාන පාරවල් නොවන පාලම් රේන්ද.

A.—කොළඹ දිස්ත්‍රික්කුවේ.

1. හැදල සහ පමුණුගම තිබෙන හැදල ඇල රේන්දය ජෝසප්ගේ ඇල කියන ඇලට ජර 642ක් උතුරෙන් පමුණුගම පරණ මීගමුඇලේ බස්නාහිර පැත්තේ ඉවුරේ ස්ථානයක තිබෙන හැදල ඇලරේන්ද.

2. කිත්තන්පහුවේ ඇල රේන්දය.

අයකරන ස්ථාන.—දෙමටගොඩ ලොග්ගේට්ටුවේ සහ අත්තිඩියේ, එක රේන්ද පලකට ගෙව්විට අනිත් රේන්දපලෙන් පසුවදාට නිදහස්ව යන්ට පුළුවන.

B.—මීගමු දිස්ත්‍රික්කුවේ.

පල්ලන්සේන පාලම සමීපයේ තිබෙන මීගමු ඇලේ රේන්දය. රේගුව පාරේ ඇල දෙරටුවෙහි පාලමේ මීගමුඇලේ රේන්දය. එක රේන්දපලකට ගෙව්විට අනිත් රේන්දපලෙන් නිදහස්ව යන්ට පුළුවන.

C.—කළුතර දිස්ත්‍රික්කයේ.

(a) කළුතර පරණ ඇලේ කැපූ ඇලමෝදර තිබෙන රේන්දය සහ ගල්තුඩේ රේන්ද, එක රේන්දපලකට ගෙව්විට අනික් රේන්දපලෙන් නිදහස්ව යන්ට පුළුවන.

(b) කළුතර අළුත්ඇලේ හතරමෝදර රේන්ද.

ඇම්. ඇම්. වැබර්බර්න්,
ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ.

වර්ෂ 1931ක්වූ ජූලි මස 22වෙනි දින
කොළඹ කච්චේරියේදීය.

---

රා සහ අරක්කු තැබෑරුම් සම්බන්ධව වර්ෂ 1912යේ අංක 8 දරන ව්‍යවස්ථාව යටතේ දැන්වීම.

කළුතර දිස්ත්‍රික්කයේ රා රේන්ද, 1931–32.

වර්ෂ 1931ක්වූ මාර්තු මස 20වෙනි දින සහ නො. 7,837 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ රා රේන්ද විකිණීමේ කොන්දේසිවලට සහ සියලුම ඇක්සයිස් ලයිසන්වලට වැටහෙන සාමාන්‍ය කොන්දේසිවලට යටත්ව, පහත දක්වන ෂැඩුල්පත්‍රයෙහි සඳහන්වූ මන්ඩියේ වර්ෂ 1931ක්වූ ඔක්තෝබර් මස 1වෙනි දින පටන් වර්ෂ 1932ක්වූ සැප්තැම්බර් මස 30වෙනි දින දක්වා ඇති දෙලොස් මාසය තුළ රා බෙදා විකිණීමේ අයිතිවාසිකම, වර්ෂ 1931ක්වූ අගෝස්තු මස 1වෙනි සෙනසුරාදා පෙරවරු 10ට කළුතර කච්චේරියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන බැව් මෙයින් දැනුම්දෙමි.

2. රේන්දය ලැබූ අය, රේන්දය ලැබූ බැව් ප්‍රකාශවූ වහාම රේන්ද විකිණීමේ කොන්දේසි අත්සන්කොට ඇප බැඳීමක් වශයෙන් මාස 2ක රේන්ද මුදලට සමාන මුදලක් ආණ්ඩුවේ උප ඒජන්තතුමාට නො. 5 දරණ කොන්දේසිය ප්‍රකාර ගෙවිය යුතුයි.

3. විකිණීම පිළිබඳ වැඩිදුර කරුණු කළුතර කච්චේරියෙන් දැනගන්ට පුළුවන.

ෂැඩුල්පත්‍රය.

| නො. | කොට්ඨාසය. | මන්ඩිය. |
| --- | --- | --- |
| 1 .. | කළුතර තොටමුනේ .. | අළුත්ගම නගරය තුළ |

අරින වහන වේලාවල් : පෙරවරු 8ට සිට පස්වරු 6.30 දක්වා.

ඇල්. ඇල්. හන්ටර්,
ආණ්ඩුවේ උප ඒජන්ත වමිග.

වර්ෂ 1931ක්වූ ජූලි මස 15වෙනි දින
කළුතර කච්චේරියේදීය.

---

කළුතර දිස්ත්‍රික්කයේ අරක්කු රේන්ද, 1931–32.

වර්ෂ 1931ක්වූ ඔක්තෝබර් මස 1වෙනි දින පටන් වර්ෂ 1932ක්වූ සැප්තැම්බර් මස 30වෙනි දින දක්වා මාස 12ක, මීට යාකර තිබෙන A අක්ෂරය දරණ ෂැඩුල් පත්‍රයෙහි සඳහන්වන තැබෑරුම්වල අරක්කු විකිණීමේ තනි බලය (නොහොත් රේන්දය) සම්බන්ධ ටැන්ඩර් වර්ෂ 1931ක්වූ මාර්තු මස 20වෙනි දින සහ නොම්මර 7,837 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ (වර්ෂ 1931ක්වූ ජූනි මස 5වෙනි දින සහ නො. 7,858 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධකරණලද ඇක්සයිස් නොතීසියකින් අමුතුකරණලැබූ) "අරක්කු රේන්ද විකිණීමේ කොන්දේසිවලට" සහ සියලුම ඇක්සයිස් ලයිසන්වලට වැටහෙන සාමාන්‍ය කොන්දේසිවලට යටත්ව භාරගනු ලැබේ.

2. ආණ්ඩුවේ උප ඒජන්තතුමාට සුදුසුයයි වැටහෙන අන්දමට යම්කිසි ටැන්ඩරයක් භාරගැනීමට හෝ නොගැනීමට ඔහුට බලය තිබේ. ඒ බලයට යටත්ව (තීරුව සහ අරක්කුවල වටිනාකම හැර) රේන්දය වශයෙන් ඉතා වැඩි ගණන ටැන්ඩර්කරපු අයට විකිණීමේ බලය දෙනවා ඇත.

3. හැම ටැන්ඩරයම නියම ෆෝර්මයකින් කළයුතුය. එය කළුතර කච්චේරියෙන් ලබාගත හැක. එබඳු ටැන්ඩරයට අවලංගු නොකරපු (කැන්සල් නොකරපු) රුපියල් 10ක මුද්දරයක් ඇලවිය යුතුයි. ටැන්ඩරය භාරගත්තා හෝ නොගත්තා හෝ එහි වටිනාකම ආපසු දෙනු නොලැබේ.

4. එක එක තැබෑරුමට වෙන වෙනම ටැන්ඩර් ෆෝර්ම පාවිච්චිකරන්ට ඕනෑය. එක තැබෑරුමකට එක් අයෙකුගෙන් එක ටැන්ඩරයකට වඩා භාරගනු නොලැබේ. සියලුම ටැන්ඩර් තමා නමින්ම දමන්ට ඕනෑය. ඒජන්තකෙනෙකුගේ නමින් දමනලද ටැන්ඩර් භාරගනු නොලැබේ.

5. කච්චේරියක හෝ මුදල් භාණ්ඩාගාරයක රුපියල් 500ක් බැඳ එහි කුවිතාන්සිය හැම ටැන්ඩරය සමග එවන්ට ඕනෑය. කුවිතාන්සියේ නොම්මරයද දිනද ටැන්ඩරයේ සඳහන්කරන්ට ඕනෑය.

6. ටෙන්ඩරය ලැබූ අය නොහොත් සළුලවූ ටැන්ඩර් කාරයා ටෙන්ඩරය ලැබූ වහාම, ටෙන්ඩර්විකිණීමේ කොන්දේසි අන්සන්කොට ඇප බැඳීමක් වශයෙන් ටෙන්ඩරයේ වටිනාකමෙන් මාස 3ක වටිනාකමට වැටෙන මුදලක් කච්චේරියේ බඳින්ට ඕනෑය.

7. වර්ෂ 1931ක්වූ අගෝස්තු මස 1වෙනි සෙනසුරාදා පෙරවරු 11ට හෝ ඊට මත්තෙන් කළුතර කච්චේරියට ලැබෙන ප්‍රකාර ටැන්ඩර් එවිය යුතුයි. ටැන්ඩර්කාරයෝ එකී වේලාවට කච්චේරියේ සිටින්ට ඕනෑය.

8. වැඩිදුර කාරුණු කළුතර කච්චේරියෙන් ලබාගත හැකිවේ.

ඇල්. ඇල්. හන්මර්,
ආණ්ඩුවේ උප ඒජන්ත වෙනුව.

වර්ෂ 1931ක්වූ ජූලි මස 15වෙනි දින
කළුතර කච්චේරියේදීය.

A. ෂැඩුල් පත්‍රය.

කළුතර දිස්ත්‍රික්කයේ අරක්කු රෙන්ද කොට්ඨාසය.

| නො. | කොට්ඨාසය. | පලාත. |
|---|---|---|
| 1 | කළුතර කොටමුනේ | .. කලමුල්ල |
| 2 | එම | .. දියලගොඩ |

කැබැරුම් අරින වසන වේලාවල්: උදේ 8ට සහ සවස 6.30ට

## උසාවිය නීති.

B 6/31

1896 අංක 13 දරන වන්‍දනාගමන් පිළිබඳ ආඥාපනත.

මුන්නේස්සරම් දෙවස්ථානයේ මඞ්ගල්‍යය සම්බන්ධ ව්‍යවස්ථා.

වන්‍දනාගමන් පිළිබඳ ආඥාපනතකැයි නම්ලත් 1896 අංක 13 දරන ආඥාපනතේ 1වෙනි වගන්තිය යටතේ ආණ්ඩුකාරයාණන්වහන්සේ විසින් පණවනලද ව්‍යවස්ථා.

උතුමාණන්වහන්සේගේ අණපරිදි,

සී. සී. වූලි,
ආණ්ඩුකාරයාණන්වහන්සේගේ ලේකම්තැන වෙනුව.

වර්ෂ 1931ක්වූ ජූලි මස 23වෙනි දින
කොළඹ රජවාසලදීය.

### ව්‍යවස්ථා.

1. මෙම ව්‍යවස්ථාවල "ලැගුම්භූමිය" යන්නෙන් හඟවන්නේ මීට යාකර තිබෙන උප ලේඛනයෙහි සඳහන්වන සීමාතුළ පිහිටි භූමිභාගයයි. "උප දිසාපතිතැන" යන්නෙන් හඟවන්නේ පුත්තලම හලාවත දෙපළාතේ උප දිසාපතිතැනයි.

2. උප දිසාපතිතැනගේ විශේෂ හෝ සාමාන්‍ය අණවකින් ලැගුම්භූමියතුළ ලැගුම්ගැනීම තහනම්කරනලද කිසිම ස්ථානයක කිසිවකු විසින් ලැගුම්ගත යුතුනොවේ.

3. ශරීර කෘත්‍ය සඳහා උප දිසාපතිතැන විසින් හෝ ඔහුගේ අනුමතය ඇතුව වෙන්කර තිබෙන ස්ථානවල හැර ලැගුම්භූමියතුළ අන් කිසිතැනක කිසිවකු විසින් මලමූත්‍ර නොකළ යුතුයි.

4. උප දිසාපතිතැන විසින් හෝ ඔහුගේ අනුමතය ඇතුව ඒ සඳහා වෙන්කර තිබෙන ස්ථානවල හෝ භාජනවල මිස ලැගුම්භූමියේ වෙන තැනක කිසිවකු විසින් කුණුකසළ දැමිය හෝ කුණුවතුර නොදැමිය යුතුයි.

5. (a) ලැගුම්භූමියතුළවත් හරක් ගාල්වක් වශයෙන් විශේෂයෙන් නියම්කර තිබෙන තැනක හෝ ඒ සඳහා උප දිසාපතිතැන විසින් මැනවැයි අනුමතකරනලද තැනක හෝ මිස ලැගුම්භූමිය අසල වෙන තැනකවත් ගවයින් තබාගත යුතුනොවේ.

(b) ගවයින් භාරව සිටින අය විසින් ලැගුම්භූමිය ඇතුළත පහරන සතුන්ගේ ගොම ඇද ඊට නියම්කර තිබෙන ස්ථානයකට ගෙනයන්ට සැලැස්විමද ගවයින් ලැග්ගතැන හීතරම පවිත්‍රව තබාගැනීමද යුතුවේ.

6. ආහාර පිණිස සාදා ලැගුම්භූමියතුළ විකුණනුලබන සියලුම කෑම ජාති (a) පිරිසිදු කබඩ්සිවල නොහොත් රෙදිවල දවටා හෝ ඉන් වසා හෝ, (b) වසනලද විදුරු පෙට්ටිවල දමා හෝ, (c) ලැගුම්භූමිය බාර සනීපාරක්ෂක නිලධාරීතැන විසින් හෝ වෛද්‍ය නිලධාරිතැන විසින් මැනවැයි පිළිගන්නාලද වෙනත් පියන් සහිත භාජනවල දමා හෝ මැස්සන්ගෙන් හා දූවිල්ලෙන් ආරක්ෂාකළ යුතුයි.

7. බෝවෙන රෝගයකින් පෙළෙන කෙනකුට හෝ ලැගුම්භූමියේ පවිත්‍රකමට බාධාවක්ව සිටියහැකි කෙනකුට ලැගුම්භූමියට ඇතුල්වන්නට ඉඩ නොදිය යුතුයි.

8. මඞ්ගල්‍ය කාලයතුළදී ලැගුම් භූමියෙහි යම් වසංගත රෝගයක් හටගැනුණිනම් වන්‍දනාකාරයින්ට වන්‍දනාභූමියෙන් පිටවීයන්නවද, පිටවී යන මාර්ගය සහ ඔවුන් ගෙනයන ක්‍රම නියම්කරන්නටද උප දිසාපතිතැනට පුළුවන.

9. (a) ලැගුම් භූමිය තුළ බෝවෙන හෝ පැතිරෙන රෝගයකින් පෙළෙන සෑම අයද, (b) ඔහු එසේ පෙළෙන බව දැන දැනම ඔහු සමග වාසයකරන සෑම අයද ඒ රෝගියා ගැන ලැගුම් භූමිය බාරව සිටින සනීපාරක්ෂක නිලධාරීතැනට හෝ වෛද්‍ය නිලධාරීතැනට දැනුම්දෙන්නට ඕනෑය.

10. ලැගුම් භූමියතුළ යම් වැවක් හෝ ලිඳක් යම් නියමකට යුත්තක් සඳහා වෙන්කොට ඒ බවට ඒ ස්ථානයෙහි දැන්වීමක් ගසා තිබෙනවිට එම වැව හෝ ලිඳ එය වෙන්කොට තබා තිබෙන කටයුත්ත සඳහා හැර අන්කිසි දෙයකට කිසිවකු විසින් නොයෙදිය යුතුයි.

11. පාන්සෙයක් සිසිල්බීම සාදන ස්ථානයක් හෝ ශාලක් තැබීම පිණිස උප දිසාපතිතැනගෙන් කලින් බලපත්‍රයක් ලබා නොගෙන කිසිවකු විසින් ලැගුම්භූමියතුළ එබඳු ස්ථානයක් තබාගත යුතුනොවේ. බලපත්‍රය නොමිලයේ දෙනු ලැබේ.

12. උප දිසාපතිතැනගෙන් කලින් අවසර ලබානොගෙන කිසිවකු විසින් ලැගුම්භූමියේ මහ වීදියෙන් හෝ වෙනයම් වීදියකින් අනුමනෙස් යම් කඩයක් තැනීම හෝ වෙනයම් ගොඩනැගිල්ලක් දික්කිරීම යුතුනොවේ.

13. උප දිසාපතිතැනගෙන් කලින් අවසර ලබා නොගෙන කිසිවකු විසින් ලැගුම්භූමිය තුළ හෝ එහි මායිම්වල සිට හැකැප්මක් ඇතුළත හෝ ගිනිකෙළි හෝ තුවක්කු පත්තු නොකළ යුතුයි.

14. උප දිසාපතිතැන විසින් හෝ ඔහුගේ අනුමතය ඇතුව ඒ සඳහා නියම්කර තිබෙන ස්ථානයක හැර ලැගුම්භූමිය තුළ කිසිවකු විසින් සතුන් නොමැරිය යුතුයි. තවද එබඳු ස්ථානයෙහි සතුන් මරන සෑම අයම එය පවිත්‍රව තබාගැනීම ගැන වගකිය යුතුවේ.

---

### උප ලේඛනය.

මුන්නේස්සරම් දේවාලයේ ලැගුම්භූමියේ සීමා.

උතුරට—පාලකුලම, කොහොඹගස්පිටිය, මුන්තරංදළුව සහ මුන්නේස්සරම්කුලම; දකුණට මුන්නේස්සරම්වෙල සහ හල්ලනයාගමකුලම; නැගෙනහිරට මුන්නේස්සරම්කුලම, හලාවත සිට කුරුණෑගලට යන මහපාර සහ හල්ලනයාගම කුලම; බස්නාහිරට මුන්නේස්සරම්වෙල, හලාවත සිට කුරුණෑගලට යන මහපාර සහ පාලකුලම.

---

## දැන්වීමයි.

හලාවත දිස්ත්‍රික්කුවේ උතුරු පිටිගල්කෝරළේ මුන්නස්සරමේ වර්ෂ 1931ක්වූ අගෝස්තු මස 1වෙනිදා සිට එම මස 27 වෙනිදා දක්වා පවත්වන්ට යන මඞ්ගල්‍යෝත්සවයේදී මින් පහත දක්වන සෙල්ලම් පාවත්තුකිරීම තහනම් බව මෙයින් දැනුම්දෙමි.

1. සල්ලිවලට වලයන් විසිකිරීම.
2. අශ්වරේස්.
3. ත්‍රිඩබල් යෙවත් තුන දෙක.
4. එකට හතර.
5. කැට විසිකිරීම.
6. සෑම විදියේම ලොතරැයි ගැසීම.

කේ. අල්වාපිල්ලේ,
ආණ්ඩුවේ උප ඒජන්ත උන්නාන්සේ වෙනුවට.

වර්ෂ 1931ක්වූ ජූලි මස 15වෙනි දින
පුත්තලම් කච්චේරියේදීය.